ඌව පලාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Uva Provincial Education Department

චිත්‍ර කලාව Art	51	S	I	පැය තුනයි Three hours

විභාග අංකය : ..... 13 ශ්‍රේණිය

උපදෙස්:

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකින් සමන්විත ය.

  I කොටස
  - ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
  - එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ඉදිරියෙන් ඇති නිත් ඉර මත ලියන්න.

  II කොටස
  - අනුකොටස් තුනකින් සමන්විත ය.
  - 'අ' කොටසින් ප්‍රශ්න දෙකක් හා 'ආ' සහ 'ඇ' යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- I කොටසට හා II කොටසට අයත් පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දෙන්න.

- ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැලපෙන වරණය තෝරන්න.

1. ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික ගුහා චිත්‍ර අතර උත්කීරණ ක්‍රමය අනුව සිත්නම් කර ඇති 'ඇතා සහ පැටියා' සිතුවම දක්නට ලැබෙනුයේ,
   1. තන්නිරිමලේ ගුහාවෙහිය.
   2. බටදොඹ ලෙනෙහිය.
   3. දොරවක ලෙනෙහිය.
   4. බිල්ලෑව ලෙනෙහිය.
   5. වෙට්ටම්බුගල ලෙනෙහිය. (...3...)

2. ඉන්දු නිමන ශිෂ්ටාචාරයෙන් හමු වූ මව් දෙවගන රූපවලින් බොහෝමයක්,
   1. විවිධ පාෂාණ වර්ග භාවිතයෙන් තෙළා ඇත.
   2. ලෝකඩ මාධ්‍යයෙන් වාස්තු කරන ලද නිර්මාණ වේ.
   3. මැටියෙන් තනා පුලුස්සා ගත් ටෙරාකොටා නිර්මාණ වේ.
   4. කොටස් වශයෙන් නිර්මාණය කර සම්බන්ධ කරන ලද ඒවා වේ.
   5. වෘක්තරූපි ව නෙළන ලද කුඩා මූර්ති වේ. (...3...)

3. පශ්චාත් උපස්ථිතිවාදී එකම ශිල්පියෙකුගේ නිර්මාණ වනුයේ,
   1. අර්නාපල් බුදින්නෝ හා කහ පැහැති ජේසුස් වහන්සේය.
   2. සයිප්‍රස් ගස් හා තහිටි ළඳුන්ය.
   3. රාත්‍රී අවන්හල් හා හිරගෙදර ආලින්දයය.
   4. කාඩ් සෙල්ලම් කරන්නෝ හා තරුපිරි රැය ය.
   5. ආර්ලස් හි පාලම හා චික්ටරි කන්ද ය. (...3...)

4. පොළොන්නරුවේ දළදා මළුව නම් වූ සුජනීය බිමේ හමුවන ආගමික ස්මාරකය වනුයේ,
   1. සත්මහල් ප්‍රාසාදය, බද්ධසීමා ප්‍රසාදය හා නිශ්ශංක ලතා මණ්ඩපයයි.
   2. අටදාගේ, හැටදා ගේ හා වටදාගෙයයි.
   3. ථූපාරාමය, ලංකාතිලකය, හා තිවංක පිළිමගෙයයි.
   4. විජයොත්පනය, නිස්සංක මාලිගය හා රාජවේශීභූජංග මණ්ඩපයයි.
   5. රන්කොත් චෛත්‍ය, කිරි චෛත්‍ය හා සබළු චෛත්‍යයයි. (...2...)

CamScanner

5. යුරෝපා ප්‍රාග් ඓතිහාසික සිත්තම් වල හා ශ්‍රී ලංකා ප්‍රාග් ඓතිහාසික ලෙනේ තුළ ඇති සක්ක්‍රව රූ සැසඳීමෙදී කැපී පෙනෙන ලක්ෂණය වනුයේ ශ්‍රී ලංකාවේ ලෙන් තුළ ඇති සක්ක්‍රව රූ,

1. ප්‍රමාණයෙන් කුඩා වීමයි.
2. ප්‍රමාණයෙන් විශාල වීමයි.
3. එළිමහනේ ඇඳ නිබීමය.
4. ප්‍රාථමික ලක්ෂණ සහිතව සංකේතවත් වීමය.
5. ස්වභාවිකත්වයෙන් යුතුව ඇඳ නිබීම ය. (.....1.....)

ප්‍රශ්න අංක 6 සිට 10 තෙක් අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර පහත 1 සිට 7 දක්වා නම් කර ඇති පහත සඳහන් චිත්‍ර කොටස් ඇසුරු කරගෙන තෝරන්න.



1




2



3



4



5



6



7

6. මෙම සිත්තම් අතුරෙන් පැරණිම බෞද්ධ සිතුවම කුමක්ද?

1. 2
2. 3
3. 4
4. 5
5. 6

(...4....)

7. මෙම සිතුවම් අතුරෙන් ලෙන් විහාර තුළ දක්නට ඇති සිතුවම් මොනවාද?

1. 2,3,7
2. 2,5,7
3. 3,5,6
4. 3,5,7
5. 5,6,7

(...5...)

8. මෙම සිතුවම් අතුරෙන් කහා සැකසූ ලෙන් තුළ ඇති සිතුවම කුමක්ද?

1. 2
2. 3
3. 4
4. 5
5. 7

(...2....)

9. මෙම සිතුවම් අතුරෙන් එකම යුගයක නිර්මිත සිතුවම් ලෙස සැලකෙනුයේ මොනවාද?

1. 1,3,4
2. 1,3,5
3. 2,6,5
4. 3,4,5
5. 3,4,5

(...3....)

10. බාහිර ගල්බිත්තියේ දක්නට ඇති සිතුවම් මොනවාද?

1. 2,5
2. 2,6
3. 3,7
4. 5,6
5. 6,7

(...2....)

CamScanner

ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් A සිට E දක්වා නම් කර ඇති පහත සඳහන් චිත්‍ර කොටස් ඇසුරු කරගෙන තෝරන්න.


A
ජූලියස්


B
නාග්


C
ගිරි


D
වටදාගෙය


E
ගල් විහාර

11. A අක්ෂරයෙන් දැක්වෙන්න 'ජූලියස් සීසර්' මූර්තියෙන් නිරූපණය වන්නේ,
    1. අධිරාජ්‍යවාදියෙකුගේ බාහිර අලංකරණය සහ දිව්‍යමය ස්වභාවය යි.
    2. අධිරාජ්‍යයකුගේ බල පරාක්‍රමය සහ තේජවන්ත බවත්ය.
    3. අධිරාජ්‍යවාදී ස්වරූපයට වඩා සාමාන්‍ය මිනිසෙකුගේ විලාසයන්ය.
    4. මූර්තියෙහි සුමට වයනය හා මංශමය සැබෑස්ම නිරූපණය වීමය.
    5. ජූලියස් සීසර්ගේ පෞද්ගලික චරිත ලක්ෂණ නිරූපනය බවය. (.....)

12. B අක්ෂරයෙන් දැක්වෙන බුදු පිළිමය,
    1. මථුරා කලාවට අයත් විරාසන ක්‍රමයෙන් යුත් ගාන්ධාර පිළිමය වේ.
    2. මද සිනහවක් සහිත මථුරා කලාවට අයත් පිළිමයකි.
    3. හිස වටා ප්‍රභාමණ්ඩයක් සහිත කනා පිළිමය වේ.
    4. සිංහරූප 3ක් සහිත ආසනයක් මත පද්මාසන ක්‍රමයට ක්‍රමයට වැඩ හිඳින මථුරා කලා පිළිමය වේ.
    5. මථුරා කලාවට අයත් පද්මාසන ක්‍රමයට වැඩ හිඳින ප්‍රතිමාවකි. (...4...)


13. C අක්ෂරයෙන් දැක්වෙන ශිව සෝමස්කන්ධ මූර්තියෙන් සංකේතවත් වන්නේ,
    1. ශිව හා පාර්වතී දේවියගේ විවාහ උත්සවයයි.
    2. ස්ත්‍රී සහ පුරුෂ බලයන්ගේ සුසංයෝගයයි.
    3. ශිව දෙවියන්ගේ බල පරාක්‍රමයයි.
    4. ශිව සහ පාර්වතී දෙවියන්ගේ දිව්‍යමය ප්‍රේමයයි.
    5. පාර්වතී ශිව දෙවියන්ගේ පතිනිය බවයි. (...2...)

14. D අක්ෂරයෙන් දැක්වෙන බුදු පිළිමය හමුවන්නේ,
    1. මැදිරිගිරිය වටදාගෙය තුළිනි.
    2. අම්බස්තල දාගැබ අසලිනි.
    3. පොළොන්නරු වටදාගෙය අසලිනි.
    4. නිරියාය වටදාගෙය තුළිනි.
    5. ථූපාරාම චෛත්‍ය අසලිනි. (...3...)

15. E අක්ෂරයෙන් දැක්වෙන ගල් විහාරයේ සමාධි බුදු පිළිමය,
    1. පල්ලව ආභාසය මත නිම කෙරුණකි.
    2. මහායාන සංකල්පයක් අනුව නෙලන ලද්දකි.
    3. අමරාවතී ශෛලියෙන් කරන ලද්දකි.
    4. මථුරා කලා සම්ප්‍රදාය මත නිමවූවකි.
    5. ගුප්ත ආභාසයෙන් යුතුව නිම කෙරිණි. (...2...)

CamScanner

පහත ප්‍රශ්න 16 සිට 20 තෙක් අසා ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් F සිට I දක්වා නම් කර ඇති පහත සඳහන් චිත්‍ර කොටස් ඇසුරු කරගෙන තෝරන්න.


G


H


I


J


K

16. G අක්ෂරයෙන් දැක්වෙන ඉන්දීය සිතුවම් නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින්ද?
    1. යුරෝපීය ශාස්ත්‍රාලීය ලක්ෂණ භාවිතා නොකළ රාජා රවි වර්මා ය.
    2. ඉන්දීය ලක්ෂණ ගුරුකොට ගත් නන්දලාල් බොස් ය.
    3. යුරෝපීය පශ්චාත් උපස්තිතිවාදී ආභාසය ලද අම්රිතා ෂර්ගිල් ය.
    4. යුරෝපීය යථාර්ථවාදයට එරෙහිව සිතුවම් කළ අබනීන්ද්‍රනාත් තාගෝර් ය.
    5. ඉන්දීය ජන කලා සම්ප්‍රදායන්ගේ ආභාසය ලත් ජෙමිනි රෝයි ය. (...3...)

17. H අක්ෂරයෙන් දැක්වෙන 'අසංකාසුර සංහාරම්' චිත්‍රය පිළිබඳ නොගැලපෙන ප්‍රකාශය කුමක්ද?
    1. බටහිර කලා සම්ප්‍රදාය අනුව ත්‍රිමාණ ලක්ෂණ දැක්වෙන සේ චර්ණ යොදා ඇත.
    2. කතා කිරීමේ ශෛලියෙන් බැහැරව පෙරදිග කලා ලක්ෂණ සහිතව නිර්මාණය කර ඇත.
    3. ශාස්ත්‍රාලීය යථාර්ථවාදී කලා ලක්ෂණ තෝවිල් සිතුවම් කලාවට ගෙන ඒමට උත්සහ දරා ඇත.
    4. රාජා රවි වර්මාගේ කලා ශෛලියෙන් ආභාසය ලබා ඇත.
    5. අන්ග්ලෝ ඉන්දියානු සාම්ප්‍රදායික ලක්ෂණ අනුව ගොඩනගා ඇත. (...2...)

18. I අක්ෂරයෙන් දැක්වෙන සිතුවම නිර්මාණය කරන ලද්දේ,
    1. උපස්තිතිවාදී ක්ලෝඩ් මොනේ විසිනි.
    2. පශ්චාත් උපස්තිතිවාදී වින්සන්ට් වැන්ගෝ විසිනි.
    3. පශ්චාත් උපස්තිතිවාදී පෝල් ගොගෑන් විසිනි.
    4. උපස්තිතිවාදී එඩ්වඩ් මැනේ විසිනි.
    5. පශ්චාත් උපස්තිතිවාදී පෝල් සෝසාන් විසිනි. (...2...)

19. J අක්ෂරයෙන් දැක්වෙන සිතුවම සංරචනයේ මූලික අරමුණ වනුයේ,
    1. විවිධ මානව ශාස්ත්‍රඥයින් සඵුන්ගේ කෘතීයන්හි නිරත වන අයුරු විදහා පෙන්වීමකි.
    2. විවිධ මනඃරූන්ගේ චර්යාවන් චිත්‍ර තලය මත දැක්වීමයි.
    3. මධ්‍යගත ශෛලි නිර්මාණ ආකෘතිය හා නිවැරදි පර්‍යාලෝක මූලධර්ම මත ඇඳ දැක්වීමකි.
    4. සමාජ දර්ශනවාදීන් චිත්‍ර තලය පුරා අව්යිමත් ලෙස විසිරී යන ආකාරය ඇඳීමයි.
    5. වාස්තු විද්‍යාත්මක ලක්ෂණ හා මානව රූප ඇසුරින් සිතුවම් අදියර ගණනාවකට සැලසුම් කිරීමයි. (...3...)

20. K අක්ෂරය මඟින් දැක්වෙන සිතුවමෙහි,
    1. වලන ඉරියව් සම්ප්‍රදායික ලක්ෂණ අනුව තලය මත ගොනු කිරීමට උත්සාහ කර ඇත.
    2. රූප එකිනෙකට ගැලපීමේදී වලනය හා ක්‍රියාකාරීත්වය අතිශෝක්තියෙන් දක්වා ඇත.
    3. සංරචනමය උපක්‍රමයක් ලෙස කාන්තා රූප කවාකාර ආකෘතියකින් ගොනුකර ඇත.
    4. රිද්මයානුකූල ලයාමය මඟින් සංරචනයේ ජීව ගුණය වඩාත් ඉස්මතු වී ඇත.
    5. පාර්ශවදර්ශී මානව රූප සංයමයෙන් යුතුව තලය මත හසුරුවා ඇත. (...1...)

ප්‍රශ්න අංක 21 සිට 25 තෙක් ඇති එක් එක් ප්‍රකාශනයට වඩාත් ගැලපෙන වරණය පහත සඳහන් P, Q, R, S, T යනුවෙන් නම් කර ඇති කලාකෘති ඇසුරින් තෝරන්න.



P



Q



R



S



T

21. P අක්ෂරයෙන් දැක්වෙන දැවමය ජනේල කැටයම

1. ඇම්බැක්ගේ දේවාලයේ ඇති, මව් සෙනෙහස ප්‍රකාශිත කැටයමකි.
2. පනංචිටිය අම්බලමේ දක්නට ඇති, සාමාන්‍ය ජන ජීවිතය නිරූපිත අවස්ථාවකි.
3. මිහනුවර මහුල් මඩුවේ ඇති, රාජකීය පවුලක් දැක්වෙන කැටයමකි.
4. ඇම්බැක්ගේ දේවාලයේ දක්නට ඇති, දේව කතාවක් වස්තු විෂය කොටගත් අවස්ථාවකි.
5. පනංචිටිය අම්බලමෙහි ඇති, ප්‍රභූ කාන්තාවක් සහ පරිචාර ස්ත්‍රියක් දැක්වෙන කැටයමකි.

(..1.....)

22. E අක්ෂරයෙන් දැක්වෙන රෝමයේ ඉදි කර ඇති ට්‍රෙජන් ස්ථම්භය,

1. වැඩිම සිද්ධීන් සමූහයක් දක්නට ඇති ස්ථම්භය යි.
2. ඩෙසියන්වරු නම යුධ සටන් කැටයම් නිරීම සඳහා ඉදි කරන ලද්දකි.
3. ඇපලෝඩෝරස් ගෘහනිර්මාණ ශිල්පියා විසින් ඉදිකර කැටයම් කරන ලද්දකි.
4. රෝමවරුන්ගේ ජන ජීවිතය හා පුරාවෘත්ත පහළ සිට ඉහළට විහිදී යන අයුරෙන් නොවේ.
5. මාර්කස් ඔරැලියස් අධිරාජ්‍යාගේ ජීවිත තොරතුරු කැටයමට නගන ලද්දකි.. (...3...)

23. R අක්ෂරයෙන් දැක්වෙනුයේ,

1. යාපහුව රජ මාලිගයේ ද්වාර මණ්ඩලයේ පාදමේ ජනේල අතර දක්නට ඇති සුවරු කැටයමකි.
2. මහනුවර දළදා මාලිගයේ පඩිපෙල දෙපස දක්නට ඇති කැටයමකි.
3. යාපහුව දළදා මාලිගයේ පාදමේ බොරදම් තීරු අතර ඇති නර්තන රූප සහිත ජනේලයකි.
4. ගඩලාදෙනිය විහාරයේ පාදමේ ඇති නටන වයන කාන්තා රූප සමූහයකි.
5. ලාලිත්‍යමය ස්වරූපයෙන් යුත් නාටිකාංගනාවන්ගෙන් සමන්විත යාපහුව ජනේල කැටයමකි.

(3)

24. S අක්ෂරයෙන් දැක්වෙන ඉන්දු නිමින මුද්‍රාවෙන් නිරූපනය වන්නේ,

1. අං සහිත හිස්වැසුමක් පැළඳි දෙවියෙකු වේ.
2. වනයට හා සතුන්ට අධිපති දෙවියෙකු වේ.
3. යෝගාසන ඉරියව්වෙන් සිටින යෝගාවචරයකු වේ.
4. අං සහිත හිස්වැසුමක් පැලඳි පශුපති වේ.
5. ත්‍රිශූලයක් සහිත හිස්පලඳනාව පැළඳ සිටින ආගමික පූජක චරයකු වේ. (...4...)

25. T අක්ෂරයෙන් නිරූපිත ලෝහමය ඵලකය.

1. භාරතයේ කනිෂ්ක රජ සමයේ භාවිත වූ රන් කාසියකි.
2. ගාන්ධාරයේ ප්‍රථම වරට බුදුරුව භාවිත කරමින් නිර්මාණය වූ රන්කාසියකි.
3. බුදුරදුන්ගේ රුවක් යොදාගනිමින් මථුරා දේශයේ නිර්මාණය වූ රනින් කළ කාසියකි.
4. ග්‍රීක අක්ෂර යොදා ඇති අයුරින් ග්‍රීසියේ නිර්මාණය වූ රනින් කළ කාසියකි.
5. කණිෂ්ක රජු බුදු දහම වැළඳගැනීම සංකේතවත් කරන රන් කාසියකි. (...2...)

26. "43 කන්ඩායම" බිහිකරලීමෙදී පුරෝගාමී ශිල්පීන්ගේ අරමුණ වූයේ,

1. සම්භාව්‍ය ශාස්ත්‍රාලයීය චිත්‍ර කලාව ප්‍රචලිත කරලීමයි.
2. තත්කාලීන බටහිර ශිල්පීන්ගේ ක්‍රම ශිල්ප මෙරටට හඳුන්වා දීමයි.
3. ස්වාධීනව නව නිර්මාණ බිහිකිරීම හා චිත්‍ර කලාවට නව අරුතක් දීමයි.
4. සම්ප්‍රදාය රකිමින් සිද්ධාන්ත මත සිහිටා සිතුවම් කිරීමට ඉඩ සැලසීමයි. (...3...)
5. නවක ශිල්පීන් දේශීය චිත්‍ර කලාවට නැඹුරු කිරීමයි.

CamScanner

27. ථිඝීජ්තු වාස්තු විද්‍යාවට මූලික පදනම වූයේ,
1. පාරාවෝවරුන් වෙනුවෙන් ලෞකික ගොඩනැගිලි සෑදීමේ අවශ්‍යතාවයයි.
2. මරණින් මතු ආත්මයේ පැවැත්ම සඳහා වූ ඇදහිලි පද්ධතියයි.
3. මළවුන්ගේ මෘත ශරීර තැන්පත් කිරීමේ අවශ්‍යතාවයයි.
4. පාරාවෝ වරුන්ගේ බලපරාක්‍රමය දැක්වීමට ගත් උත්සාහයයි.
5. පාරාවෝවරුන්ගේ ජීවිතය පිළිබඳව සිහිවටන තැබීමේ උවමනාවයි. (...2...)

28. මෝගල් හා රාජපුම් යනුවෙන් හඳුන්වනු ලබන චිත්‍ර සම්ප්‍රදායන් දෙක,
1. චිත්‍ර එක සමාන තේමාවලින් චිත්‍ර ඇඳි සමකාලීන ආයතන දෙකකි.
2. මෝගල් රජවරු විසින් ඉන්දියාවේ මධ්‍ය හා කඳුකරයේ පිහිටවූ ශිල්පායතන දෙකකි.
3. අනුපිළිවෙලින් ආගමික තේමා සහ ලෞකික තේමා නිරූපණය කළ ඒවාය.
4. අනුපිළිවෙලින් රාජ්‍ය තේමා සහ ගින්දු ආගමික හා සාගිතය තේමා නිරූපණය කළ ඒවාය.
5. අනුපිළිවෙලින් රාජ්‍ය නොරතුරු හා සමාජීය නොරතුරු නිරූපණය කළ ඒවා වේ. (...4...)

29. ගෘහික් නිර්මාණකරුවකු වඩාත් කාර්යක්ෂම විය යුත්තේ,
1. විවිධාකාරයේ අක්ෂර නිර්මාණය කිරීම සඳහා,
2. සන්නිවේදන අවශ්‍යතා සඳහා නව නිර්මාණ කිරීම සඳහා,
3. ප්‍රචාරක කාර්‍ය සඳහා පෝස්ටර් නිර්මාණය කිරීම සඳහා,
4. පොත් පිටකවර හා සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය සඳහා,
5. වාණිජ නිෂ්පාදන සඳහා දවටන නිර්මාණය කිරීම සඳහා (...2...)

30. බාගිර ශාස්ත්‍රාලයීය තාන්ත්‍රික කලාව උපරිමයට පත්ව නිබු අවධියේ චිත්‍ර කලා ලෝකයේ පෙරලියක් ඇති කිරීමට සූදෝගාමී වූ ශිල්පීන් වනුයේ,
1. පැබ්ලෝ පිකාසෝ හා ජෝර්ජ් බ්‍රාක් ය.
2. පෝල් සෙසාන් හා පෝල් ගොගෑන් ය.
3. ඔගස්ටා රොඩින් හා හෙන්රි මූවර් ය.
4. මයිලි කන්දින්ස්කි හා පැක්සන් පොලොන් ය.
5. ක්ලේඩ් මේනේ හා එඩ්වඩ් මැනේය. (...5...)

ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර ඊට ඉදිරියෙන් දී ඇති වාස්තු විද්‍යා නිර්මාණ ඇසුරෙන් **තෝරන්න.**

31. ඉන්දු නිමිනයෙන් හමු වූ නාන තටාකයේ ඇති සුවිශේෂී වාස්තු විද්‍යාත්මක අංගයක් වන්නේ,
1. එකිනෙක සම්බුව වූ පියගැටපෙළය.
2. ජාමිතික හැඩති කුඩා කුට්ය.
3. පෙරණයක් සහිත කාණු පද්ධතිය.
4. ජල පරිවහන පැන්නුම් ආරුක්කුමය. (...3...)
5. ප්‍රධාන දොරටුව අභියස ඇති කුඩා කුට්ටි ය.



32. ඇත්තෙන්ම යුකයට අයත් මෙම නිර්මාණය
1. කලු ගලින් තනන ලද පියගැට පෙළ සහිත පිවිසුම් දොරටුවයි.
2. යාපහුවේ නටඹුන් හා සම්බන්ධ පිවිසුම් දොරටුවයි.
3. ගලින් කරන ලද කැටයම් සහිත උළුවස්සකි.
4. චෝල නිර්මාණ ශිල්පය අනුව නිම් වූ යාපහුව රාජධානියේ මානල්කමයි.
5. යාපහුව දළදා මැදුර අභියස ඇති පිවිසුම් දොරටුවයි. (...5...)



33. මෙහි දැක්වෙනුයේ පොළොන්නරු යුගයේ,
1. ගඩොලින් හා හුණු ගලින් කළ ප්‍රතිමා ගෘහයකි.
2. ගර්භ ගෘහය තුළ ගිඳි පිළිමයක් සහිත ගඩොලින් කළ පිළිම ගෙයකි.
3. ගල් මාධ්‍යයෙන් කළ පිළිමයක් සහිත ගෙඩිගේ සම්ප්‍රධායට කළ ප්‍රතිමා ගෘහයකි.
4. විශාල නිම් පිළිමයක් සහිත ගලින් කළ සුවිසල් පිළිම ගෙයකි.
5. ඉදිරිපස කුළුණු දෙකක් සහිත ගඩොලින් කරන ලද ශේෂ වූ පිළිම ගෙයකි. (.....)



34. මෙහි දැක්වෙන වාස්තු විද්‍යා නිර්මාණය,



1. රාජ රාජ මෝල තම මෙහෙයිය වෙනුවෙන් කළ, අංක 2 බිම දෙවොල යි.
2. කපා සැකසූ ගල් පුවරු යොදා කළ ගිව දෙවොලකි.
3. පොළොන්නරුවේ ඕන්දූ ආගමික ථිය්වරම් දෙවොලකි.
4. දකුණුවන් විසින් තම පුද පූජා කල දෙවොලකි
5. දකුණු ඉන්දීය චෝල වාස්තු විද්‍යා ලක්ෂණ නිරූපිත අංක 1 ගිව දෙවොලයි.

(...1...)

35. මෙහි දැක්වෙන ඕවලාකාර ගොඩනැගිල්ල,



1. රංග භූමියක් මැදිවන සේ ඉදිකරණ ලද තුන්මහල් මන්දිරයකි.
2. සතුන් හා මිනිසුන් අතර සටන් නැරඹීම සඳහා යොදාගත් විශාල රංග භූමියකි.
3. රාජකීය ගනාස්ථ ප්‍රේක්ෂකාගාරයකි.
4. වහලක් නොමැතිව නිර්මාණය කළ රාජකීයන්ගේ එළිමහන් ප්‍රේක්ෂකාගාරයකි.
5. බෑවුම් සහිත වෘත්තාකාරව සැකසූන පඩිපෙල් වලින් යුත් රංග භූමියක් සහිත බලවාකර තෙමහල් මන්දිරයකි.

(...5...)

ප්‍රශ්න අංක 36 සිට 40 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර පහත සඳහන් චිත්‍රය ඇසුරෙන් තෝරන්න.



36. මෙම සිතුවම,

1. තනඟිටියානු ජන ජීවිතය සිතුවම් කළ ගොනැන්ගේ සිතුවමකි.
2. ඇමෙරිකානු ජාතික ශිල්පිනියක් වූ මෙරිකසාටිගේ සිතුවමකි.
3. ඔලන්ද ජාතික වින්සන්ට් වැංගෝගේ සිතුවමකි.
4. ප්‍රංශ ජාතික සිත්තරෙක් වූ එඩ්ගා ඩෙගාගේ සිතුවමකි.
5. උපස්ථිතිවාදී පුරෝගාමියෙකු වූ ක්ලෝඩ් මොනේගේ සිතුවමකි.

(...2...)

37. මෙම සිතුවමෙන් අර්ථවත් වන්නේ,

1. මාතෘත්වය නිරූපණය කිරීමයි.
2. දරු සෙනෙහස හා මාතෘත්වය පිළිඹිබු කිරීමයි.
3. මාතාවක් දරුවෙකුගේ පා දෝවනය කරන ආකාරයයි.
4. මවකගේ දෛනික ජීවිතයේ එක් ක්‍රියාකාරී අවස්ථාවකි.
5. වැඩිහිටි හා ළදරු ජීවිතයේ බැඳීමකි.

(...2...)

CamScanner

38. මෙම සිතුවමේ වර්ණ භාවිතයේ සුවිශේෂ ශිල්පීය ලක්ෂණය වන්නේ,

1. මූලික වර්ණ මිශ්‍ර වී පෙනෙන අයුරින් ත්‍රිමාන ලක්ෂණ භාවිතා කර තිබීමයි.
2. වර්ණ ප්‍රභේද භාවිතයෙන් ස්වභාවිකත්වය දැක්වීමට උත්සහ කර තිබීමයි.
3. ඵළිය අඳුර භාවිතයෙන් වස්තූන්ගේ ත්‍රිමාණත්වය දැක්වීමට උත්සාහ දරා තිබීමයි.
4. විෂම වර්ණයන්ගේ සංගතනාව රැකෙන පරිදි භාවිතා කොට තිබීමයි.
5. වර්ණ පදාස දැක්වෙන පරිදි සන බුරුසු පහරවල් යොදා තිබීමයි. (...3...)

39. මෙම සංරචනයේ රූපවල විලාශය වන්නේ,

1. ශෛලීගත හා ස්වභාවික හැඩ භාවිතා කිරීමයි.
2. භාව රූපී හැඩ සංකලනය කර නිර්මාණය කිරීමයි.
3. ප්‍රකාශාත්මක හා භාවරූපී හැඩ සංකලනය කිරීමයි.
4. වාස්තවවාදී හා තාත්වික හැඩ අර්ථවත්ව භාවිතා කිරීමයි.
5. ස්වභාවිකවාදී හා නිරූපණාත්මක හැඩ සංකලනය කිරීමයි. (...5...)

40. මෙම සිතුවමින් නිරූපන සම්පිණ්ඩන ක්‍රමවේදය වන්නේ,

1. මවට වඩා දරුවාට ප්‍රධාන තැනක් දක්වන සංරචනයකි.
2. සමඛරතාවය නොසලකා මානව රූප හසුරුවන ලද සංරචනයකි.
3. පසුබිමේ ප්‍රකාශනයට වඩා රූපයට මුල් තැන දුන් සංරචනයකි.
4. පසුබිමේ දර්ශනය පැහැදිලිව දක්වන සංරචනයකි.
5. පැහැදිලි දර්ශන අපැහැදිලි වනසේ දක්වන සංරචනයකි. (...3...)

PAST PAPERS WIKI

CamScanner

- අනු කොටස් දෙකකින් සමන්විත ය.
- 'අ' කොටසින් ප්‍රශ්න දෙකක් හා 'ආ' සහ 'ඇ' යන කොටස් දෙකෙන් එක් ප්‍රශ්නය බැගින් තෝරාගෙන, ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

'අ' කොටස
චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය (ශ්‍රී ලංකාව)

1. වාස්තු විද්‍යා නිර්මාණයක් ලෙස චෛත්‍යයේ ආරම්භය හා සමගාමී ව කැටයම් කලාවේ පිබිදීම, අනුරපුර බෞද්ධ නිර්මාණ කලාවේ අභිමානය දක්වන සාධක වේ.
   i. අනුරපුරයේ චෛත්‍ය නිර්මාණ ආශ්‍රිත ව එයට එක්වූ ගෘහ නිර්මාණ අංග දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   ii. අනුරපුර යුගයේ චෛත්‍ය නිර්මාණ වර්ධනය පිළිබඳ සැකෙවින් පහදන්න. (ලකුණු 05)
   iii. "අනුරපුරයේ චෛත්‍ය නිර්මාණ කලාව ආශ්‍රිත ගල් කැටයම් තුළින් ශිල්පියා තම ප්‍රතිභාව ලොවට කියාපායි" උදාහරණ සහිතව පහදන්න. (ලකුණු 08)

2. අනුරාධපුර යුගයේ පැවති බුදු පිළිම නිර්මාණ කලාව පොළොන්නරුව යුගය වන විට සුවිශේෂී ලක්ෂණ සහිත ව නිර්මාණකරණය කිරීමට ශිල්පියා යොමු විය.
   i. අනුරාධපුර යුගයේ ඉදි කළ හිටි පිළිම දෙකක් හා නිදි පිළිම දෙනක් නම් කරන්න. (ලකුණු 02)
   ii. අනුරපුර යුගයේ බුදු පිළිමවල දක්නට ලැබෙන සුවිශේෂී නිර්මාණ ලක්ෂණ කෙටියෙන් විග්‍රහ කරන්න. (ලකුණු 05)
   iii. පොළොන්නරු ගල් විහාර පිළිම කෙරෙහි මහායාන තන්ත්‍රයානය බලපෑ ඇති අයුරු ගල් විහාරයේ පළමු සමාධි පිළිමය ඇසුරෙන් පහදන්න. (ලකුණු 08)

3. පරාක්‍රමබාහු රජුගේ කාලයේ දී පොළොන්නරුවේ ඉදි වූ තිවංක පිළිමගෙය අනර්ඝ කලාගාරයකි.
   i. තිවංක පිළිමගෙයි අන්තරාලය තුළ දක්නට ඇති සිතුවම් දෙකක් නම් කරන්න. (ලකුණු 02)
   ii. ''මෙම පිළිමගෙය තුළ යුග දෙකක චිත්‍ර දක්නට ඇත.'' කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)
   iii. බෝධිසත්ත්ව සංකල්පය හා එය ප්‍රකාශ කිරීම සඳහා යොදාගෙන ඇති සංචලන ආකෘතිය 'දේවාරාධනාව' සිතුවම් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

'ආ' කොටස
චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය (ඉන්දියාව)

4. භාරතයේ ප්‍රධාන චෛත්‍ය නිර්මාණ ඇසුරු කරගෙන ඉතා දියුණු බෞද්ධාගමික කැටයම් කලාවක් බිහි වී ඇත.
   i. සාංචි තොරණ කැටයම් අනුරෙන් කුළුණුවලින් හමු වූ කැටයම් හතරක් නම් කරන්න. (ලකුණු 02)
   ii. භාරුත් චෛත්‍යයේ ගල් වැට හා කැටයම් ගැන කෙටි හැදින්වීමක් කරන්න. (ලකුණු 05)
   iii. අමරාවතී චෛත්‍යයෙන් හමු වන කැටයම් නිර්මාණ කෙරෙහි වූ මහායාන බලපෑම් පිළිබඳ ව උදාහරණ සහිත ව පහදන්න. (ලකුණු 08)

CamScanner

5. භාරතයේ වැදගත් ම බෞද්ධ විහාර සංකීර්ණයක් වූ අජන්තාව බෞද්ධ චිත්‍ර කලා නිර්මාණවලින් සුප්‍රසිද්ධ කලාගාරයකි.

i. අජන්තාවේ මහායාන ගුහා අතුරෙන් හමු වූ චිත්‍ර භතරක් නම් කරන්න. (ලකුණු 02)

ii. අජන්තා ගුහා නිර්මාණයේ දී භාවිත කොට ඇති වාස්තු විද්‍යා ක්‍රමෝපාය කෙටියෙන් පහදන්න. (ලකුණු 05)

iii. අජන්තාව යුග ගණනාවක් තුළ වර්ධනය වූ ගුහා පන්තියකි. මුල් යුගයේ නිර්මාණය වූ චිත්‍ර හා පසු යුගවල නිර්මාණය වූ චිත්‍ර අතර දැකිය හැකි වෙනස්කම් උදාහරණ සහිත ව පහදන්න. (ලකුණු 08)

'ඇ' කොටස

චිත්‍ර කලාව ඇගයීම හා රසාස්වාදය (යුරෝපය)

6. නයිල් ගංගොඩාරය පදනම් කොට ගෙන සියවස් ගණනාවක් පුරා පැවති මිසර ශිෂ්ටාචාරය කලා නිර්මාණ රාශියක් ලොවට දායාද කළ දිප්තිමත් ශිෂ්ටාචාරයකි.

i. සාම්ප්‍රදායික ලක්ෂණ පිළිබිඹු කරන පැරණි මිසර මූර්ති දෙකක් නම් කරන්න. (ලකුණු 02)

ii. අබූසිම්බල් දෙවොල නිර්මාණයේ දී යොදාගත් ශිල්පක්‍රම හඳුන්වා, එහි එදා සහ අද තත්ත්වය සැකෙවින් පහදන්න. (ලකුණු 05)

iii. පැරණි මිසර සොහොන් ගෙවල් හා දේවස්ථාන සැරසීමට චිත්‍ර හා කැටයම් යොදා ගත් අයුරු හා ඒවායේ කලා ලක්ෂණ පිළිබඳ විමසිමක් කරන්න. (ලකුණු 08)

7. පුනර්ජීවන යුගය යුරෝපයේ ප්‍රතිභාපූර්ණ ශිල්පීන් ගණනාවක් බිහි වූ යුගයකි.

i. ලියනාඩෝ ඩාවින්චිගේ නිර්මාණ භතරක් නම් කරන්න. (ලකුණු 02)

ii. මයිකල් ආන්ජලෝගේ 'අවසාන විනිශ්චය' සිතුවමේ තේමාව හා ආකෘතිය පිළිබඳ ව කෙටි විග්‍රහයක් කරන්න. (ලකුණු 05)

iii. සිද්ධි නිරූපණයේ දී මානව රූප මනස්කාන්ත අයුරෙන් නිර්මාණය කිරීමේ රෆායෙල් සෙන්ටි සතු හැකියාව 'ස්වෙන්සා ඩෙලා සිග්නවුරා' ශාලාවේ සිතුවමක් ඇසුරෙන් පහදන්න. (ලකුණු 08)

PAST PAPERS WIKI
WWW.PastPapers.WiKi
Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank
CamScanner